# සමෘද්ධි සහනාධාර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටලු
## (කුරුණෑගල දිස්ත්‍රික්කය ඇසුරින්)

අයි. පී.ඩී.ඩී.සී. ගුණදාස[1] ඩබ්.පී.ටී. වීරසේකර[2]
ආර්.පී.එස්.ඒ. රණසිංහ[3] ඩී.එන්.එස්.එන් ගුණවර්ධන[4]
ආර්.පී.එම්.ටී ජයරත්න[5] ඩබ්.කේ.ඒ.පී කුමාරි[6]
එම්.කේ. නදීකා දමයන්ති[7]

**සංක්ෂේපය**

දරිද්‍රතාව තුරන් කිරීම සහ දුප්පත් ජනතාව සවිබල ගැන්වීම සඳහා වන රජයේ ව්‍යාපෘති අතර සුවිශේෂී වැදගත්කමක් සහිත වැඩසටහනක් ලෙසට සමෘද්ධි ව්‍යාපාරය හැඳින්විය හැකිය. දිවයිනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 316ක සාමාජික පවුල් 1,479,811ක් ආවරණය ක්‍රියාත්මක වේ. සමෘද්ධි ප්‍රතිපත්තිය ක්‍රියාක්මක වීමේදී ප්‍රතිලාභීන්ගෙන් සහ නිළධාරීන්ගෙන් විවිධ ආකාරයේ ආකල්ප සහ මතිමතාන්තර ඉදිරිපත් වීඇති බව පූර්ව අධ්‍යයන හරහා අනාවරණය කරගත හැකිවිය. ඒ අනුව මෙම අධ්‍යයනයට පාදක වූ මූලික කාරණය ලෙසට සමෘද්ධි ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ප්‍රතිලාභීන්ගේ ආකල්ප විමසුමට ලක් කිරීම, සමෘද්ධි ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදීපැන නගින ගැටලු කවරේද? යන්න හඳුනාගැනීම සහ ඒවා අවම කිරීම උදෙසා ගතහැකි විසඳුම් මොනවාද? යන්න පිළිබඳව විමසුමට ලක් කිරීමයි.සමෘද්ධි ප්‍රතිපත්තිය පුළුල් ලෙස ව්‍යාප්ත වූ ප්‍රදේශයක් ලෙසට වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කය හැඳින්විය හැකිය. ඒ අනුව කුරුණෑගල දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි අදාළ නියැදිය තෝරාගෙන තිබේ. නියැදිය සඳහා සමෘද්ධි සහනාධාරලාභීන් 60ක් අහඹු ලෙස තෝරා ගෙන ඇති අතර අදාළ දත්ත ප්‍රශ්නාවලි මෙන්ම මූලික තොරතුරු සපයන්නන් සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡා හරහාද ලබාගෙන තිබේ. මෙම අධ්‍යයනයෙන් අනාවරණය වූ අන්දමට ප්‍රතිලාභීන්ගෙන් 2%ක් රුපියල් 500ට වඩා අඩු මාසික ආදායමක් සහිත පවුල්වල සාමාජිකයින් වන අතර 98%ක ආදායම රුපියල් 5000ට වඩා වැඩිය. සමෘද්ධි ව්‍යාපාරය සම්බන්ධයෙන් වන ප්‍රධාන දුර්වලතාවක් ලෙස ඉහළ ආදායම් ලබන පවුල්වලට සමෘද්ධි ප්‍රතිලාභ ලබාදීම හඳුනාගත හැක. අනෙක් අතට බිම් මට්ටමේ නිළධාරීන්ගේ ක්‍රියාකළාප හේතුකරගෙන බොහෝදුරට සහනාධාර ලැබිය යුතු පවුල් විශාල සංඛ්‍යාවකට ඒවා අහිමි වී ඇතිබවද අනාවරණය

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[2] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[3] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[4] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[5] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[6] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[7] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. damayanthi@kln.ac.lk

විය. ප්‍රතිචාරීන්ගෙන් 18% කර්මාන්ත ණය ද, 17%ක් කෘෂි සංවර්ධන වැඩසටහන්වල ප්‍රතිලාභ ද, 7% පානීය ජල පහසුකම් ද, 5%ක් අවමංගල්‍යාධාර ද, 5%ක් දිරිය පියස ණය ද, 7%ක් සමෘද්ධි ශිෂ්‍යත්ව ද ආදී වශයෙන් ප්‍රතිලාභ ලබා ඇත. මේ අනුව අඩු ආදායම්ලාභී පවුල්වලට මෙම ව්‍යාපෘතිය තුළින් විශේෂ සහන සැලසෙන බව හෙළිවේ. සමෘද්ධි වැඩසටහනෙහි ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ප්‍රතිචාරීන්ගෙන් 37% ඉතා තෘප්තිමත් හෝ තෘප්තිමත් මට්ටමේ පසු වුව ද , 34% අතෘප්තිමත් හෝ ඉතා අතෘප්තිමත් මට්ටමේ පසුවූහ. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීමේදී දුර්වලතාවලට විසඳුම් ලෙස නිළධාරීන් පුහුණුකිරීමේ නිසි ක්‍රමවේදයක් ඇතිකළයුතු අතර ණය ලබාගැනීමේ පහසුකම් පුළුල් කිරීම සිදු කළ යුතුවේ.

**මුඛ්‍ය පද ඃ** *සමෘද්ධි වැඩසටහන, දුප්පත්කම තුරන් කිරීම, දුප්පතුන් සවිබල ගැන්වීම, රාජ්‍ය ප්‍රතිපත්ති*